# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2023 අංක 24 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2023 ඔක්තෝබර් මස 17 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2023 ඔක්තෝබර් මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකි ය.

**මිල : රු. 6.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## 2023 අංක 24 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2023 ඔක්තෝබර් මස 17 වන දින]

එල්.ඩී.-ඕ. 29/2023

**2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:–

**1.** මේ පනත 2023 අංක 24 දරන සිවිල් ගුවන් සේවා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

**2.** 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 6 වන වගන්තිය, එහි (3) වන උපවගන්තියේ (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:- — 2010 අංක 14 දරන පනතේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම

"(ඉ) 31 වන වගන්තියේ (එ), (ඒ), (ඔ), (ඕ) හෝ (ක) ඡේදයේ නිශ්චිතව සඳහන් ගගන නාවික සේවා, එකී වගන්තියේ (අ) සහ (ආ) ඡේදවල නිශ්චිතව සඳහන් යම් ගගන යාත්‍රාංගනයක දී සැපයීම සඳහා සේවා සපයන්නන් ලෙස එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය යුතු යඃ

එසේ වුව ද, 31 වන වගන්තියේ (අ) හෝ (ආ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති යම් ගගන යාත්‍රාංගනයක දී මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීමට මේ ඡේදය යටතේ පත් කරනු ලබන සේවා සැපයුම්කරුවකු කැමති නොවන්නේ නම්, අමාත්‍යවරයා විසින්, මේ ඡේදයේ සඳහන් ගගන නාවික සේවා සැපයීමට වෙනත් යම් සේවා සැපයුම්කරුවකු පත් කරනු ලැබිය හැකි ය.".

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. — අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දෙස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි "ප්‍රකාශන පියස" හි දී මිල දී ගත හැකි ය.